## පන්හිඳයි - පින්සලයි

සිසිර දිසානායක

“Malini is greatly moved by the Sannaspathraya”

“මොනවද මේ මාලිනී අක්කා සන්නස පත්තරේ ගැන කියලා තියෙන්නෙ ?” පින්සල ෂ්‍යාමෙන් ජයසිංහ මහත්තයා එවලා තිබුණ ඊ-මේල් එක කියවන ගමන් පන්හිඳගෙන් ඇහුවා.

**මව් බිමේදී හා මේ බිමේදී සිංහල ජන සමාජය වෙනුවෙන් කළා වූ හා කරන්නා වූ මෙහෙවර වෙනුවෙන් සන්නස් පත්‍රයකින් පිදුම් ලැබුවා ය, මාලනී ජයසිංහ මැතිණිය. ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවරදී SCATS සංවිධානය මගින් සංවිධානය කිරීමට යෙදුනු ත්‍යාග ප්‍රදානෝත්සවයක මුඛ්‍යාංගය වූයේ මෙකී ස්තූති පත්‍ර ප්‍රධානයයි. නව වර්ෂාරම්භයේ පළවන මුල්ම ලිපිය වෙනුවෙන් මාලනිය පිළිබඳව සටහනක් තැබීම වඩාත් උචිත යැයි අප හඟින්නේ අපටම විශේෂිත වූ කිසියම් කාරණාවක් නිසාවෙනි. මේ තාක් කල් ඇය පවා නොදැන සිටි ඒ කාරණාවෙන්ම මුල පිරීම මැනැවැයි හැඟේ.**

“කෝ බලන්න……..” පන්හිඳත් කොම්පියුටරේට එබුණා. ඔය කියලා තියෙන්නේ සන්නස පත්තරය ගැන නෙවි; “සන්නස්පත්‍රය” ගැන………!

මව් බිමේදී හා මේ බිමේදී සිංහල ජන සමාජය වෙනුවෙන් කළා වූ හා කරන්නා වූ මෙහෙවර වෙනුවෙන් සන්නස් පත්‍රයකින් පිදුම් ලැබුවා ය, මාලනී ජයසිංහ මැතිණිය. ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවරදී SCATS සංවිධානය මගින් සංවිධානය කිරීමට යෙදුනු ත්‍යාග ප්‍රදානෝත්සවයක මුඛ්‍යාංග ය වූයේ මෙකී ස්තූති පත්‍ර ප්‍රධානයයි. නව වර්ෂාරම්භයේ පළවන මුල්ම ලිපිය වෙනුවෙන් මාලනිය පිළිබඳව සටහනක් තැබීම වඩාත් උචිත යැයි අප හඟින්නේ අපටම විශේෂිත වූ කිසියම් කාරණාවක් නිසාවෙනි. මේ තාක් කල් ඇය පවා නොදැන සිටි ඒ කාරණාවෙන්ම මුල පිරීම මැනැවැයි හැඟේ.

සිත්තරෙක් සිතුවමක් නිමැවීමේදී එය විඳින්නන් පිළිබඳව සේයාවක් මුලින් මවා ගන්නේය. ගේය පද නිබන්ධකයන් පද පෙළක් ගෙතීමේදී ගීයේ රසිකයා පිළිබඳව ඡායා මාත්‍රයක් මවා ගනියි. ඒ ආකාරයෙන් ම ලියන්නෙක් ලිපියක් සම්පාදනය කිරීමේ දී ද සිය පාඨකයා පිළිබඳව මනෝ රූපයක් මවා ගනිමින් ඒ අනුව ලියවිල්ල පෙළ ගන්වන්නේය. එකී මනෝ රූපය මැවෙන්නේ කිනම් වූ කාරණා මත පිහිටා ද?

තම නිර්මාණ අගයන්නා වූත්, අඩුපාඩු පෙන්වා දෙන්නා වූත්, සත්‍ය හා සාධාරණ වූ විවේචන ඉදිරිපත් කරන්නා වූත් නියම විඳින්නන්, රසිකයින්, පාඨකයන්ගෙන් ය, එකී මනෝ කාය මැවෙන්නේ.

“පන්හිඳයි – පින්සලයි” ලිපිය සම්පාදනයේ දී මව් බිමේ සහ මේ බිමේ රූපකාය ද්විත්වයක සම්මිශ්‍රණයකි නිරතුරුව මැවෙන්නේ, මව් බිමේ වෙසෙන අප මෑණියන්ගේ සහ මේ බිමේ වෙසෙන මාලිනී ජයසිංහ මැතිණියගෙ රූපකායන් ය ඒ. මව් බිමේ වෙසෙන ඇය සිංහල ආචාර්යවරියක වූවාය. මේ බිමේ වෙසෙන මැය විද්‍යාචාර්යවරියක වූවාය.

අපගේ මුල්ම ලිපියෙහි පටන්ම පාඨකයෙකි මාලනිය. එනමුදු හුදෙක් පාඨකයෙකු පමණක්ම නොවේ ය ඕ. සෘජුව අදහස්, ප්‍රතිචාර දක්වන සජීවී හා සංවේදී පාඨකයෙකි, ඇය. බස හැසිරවීමෙහි ලා මෑණියන්ගෙන් කුඩා කල පටන් ලද සතත අභ්‍යාසයක් මෙන්ම ලේඛණයේ ඇතැම් සීමා හඳුනා ගැනීමෙහි ලා මාලිනියගෙන් ලැබෙන්නා වූ ගුරුහරුකම් ද ඉමහත් ලෙස ප්‍රයෝජනවත් වේ ය අපහට. සවියක් වේ ය අපහට.


විද්‍යාචාර්යවරියක වුවද කලාව කෙරෙහි කැප වූ සිතින් ප්‍රවීණ රංගනවේදී ෂ්‍යාමෙන් ජයසිංහයන් සමඟින් විවාපත්ව යන මේ ගමනේදී මව් බිමේදී කළා වූ ද, මේ බිමේදී කරන්නා වූ ද මෙහෙවර අනුපමේයයි. ඇය ඇසුරින් නිර්මාණකරුවන්, ශිල්පීන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, නොයෙකුත් සංවිධාන ලබන්නා වූ පන්නරය අද්විතීයයි. මෙල්බර්න් හි ශ්‍රී ලාංකේය සමාජ උප කුලකයේ නායකත්වය ගන්නා කාන්තා බලකායේ නියමුවා නොවේ ද ඇය? නිසැකයෙන් ම ඇය එකී තනතුරට පත්වන්නේ නිරායාසයෙන්. මෑණියකට, ගුරු මෑණියකට පමණක් සීමා නොවී සමාජයේ විවිධ පුද්ගලයින් හා උරෙනුර ගැටෙමින් යන්නා වූ ගමනේ දී ඇය ලබන්නා වූ පරිචය නිසාවෙනි ඒ.

ඒ ගමනේදී ධනය නොපතන්නී ය ඈ. කිසිවෙකුගේ සිත නොරිදවන්නී ය, ඈ. එ ද කෙළෙසින් හෝ ඉලක්කයද සපුරාලන්නීය, ඈ. කිසිවිට දුර්මුඛ නොවන්නීය ඈ. කිසිවිට දුර්වල නොවන්නීය ඈ. කිසිවිට වියපත් නොවන්නීය ඈ. එනමුදු දින දින මුහුකුරා යන්නීය ඈ.

ඇයගේ ගමන් මගෙහි සැබෑ හරස්කඩකි SCATS සංවිධානය විසින් පසුගිය දා පිදුවා වූ ස්තූති පත්‍රයෙහි අන්තර්ගතය:

- වර්ෂ එක්වා දහස් නවසිය හැත්තෑ නවය දක්වා විද්‍යාචාර්යවරියක වශයෙන් විසි වසරක් රජයේ පැසැල්වලට කළා වූ අනුපමේය සේවය වෙනුවෙන් ද;
- කොළඹ මියුසියස් බාලිකා විද්‍යාලයේ විද්‍යාචාර්යවරියක වශයෙන් පසළොස් වසරක් පුරා කළා වූ සේවය වෙනුවෙන් ද;
- මව් බිමේ ගුවන්විදුලි හා රූපවාහිනී මාධ්‍යයන් හරහා විද්‍යාව ඉගැන්වීමේ පුරෝගාමී මෙහෙවර වෙනුවෙන් ද;
- ශිෂ්‍ය පෞර්ෂාවර්ධනය සඳහා උපදෙස් දෙමින් හා පුහුණු කරවමින් ඒ කෙරෙහි වූ උනන්දුව වෙනුවෙන් ද;
- සිය විවේක කාලය පාසැල් වේදිකා නිෂ්පාදනයට හා තරඟ සඳහා සූදානම් කරවීමට නොකඩවා වූ කැපවීම වෙනුවෙන් ද;
- දයානන්ද ගුණවර්ධනයන්ගේ Amatur Dramatic Society හි පළමු ලේකම්වරිය වශයෙන් කළ සේවය හා එතුමන්ගේ “ඇමති පට්ටම” වේදිකා නාට්‍යයේ කළ රඟපෑම වෙනුවෙන් ද;
- “නරි බෑණා”, “බක්මහ අකුණු”, “කපුවා කපෝති” හා “හුණු වටයේ කතාව” වේදිකා නාට්‍යයන් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි දී නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ද;
- “මනමේ”, “මහාසාර” යන වේදිකා නාට්‍යයන්වල මෙල්බර්න් නිෂ්පාදනයන් සංවිධානය කිරීම වෙනුවෙන් ද;
- Committee of Sri Lanka සංවිධානයේ සංස්කෘතික සම්බන්ධීකරණ නිළධාරිනිය වශයෙන් නිදහස් උත්සව හා අනෙකුත් සංස්කෘතිකාංග සංවිධානය කිරීම වෙනුවෙන් ද;
- වැඩිහිටියන් මෙන්ම යෞවන-යෞවනියන් සමඟ ක්‍රියාශීලීව හා නිර්මාණශීලීව එක් වෙමින් ඔවුන්ගේ කුසලතා එළි දැක්වීමට කටයුතු කිරීම හා ඔවුන් උද්යෝගිමත් කිරීම වෙනුවෙන් ද;
- දෙවසරකට වරක් පැවැත්වෙන SCATS නාට්‍ය උළෙල සංවිධානය කිරීමත්, SCATS සංවිධානයේ ගරු සභාපතිනිය වශයෙන් කළා වූ අනුපමේය සේවයත්, වර්තමාන ගරු ලේකම්වරිය වශයෙන් කරන්නා වූ සේවයත් වෙනුවෙන් ද;

# මාලිනියේ……



දියෙන් කිරම වෙන්කරනා හංස තුඩග සේ මා
කසළ බැහැර කර හරිනා නුවණ තියුණු වේ වා!
නවමු වසර වෙත එඩනා "සන්නස" පත ගාවා
හරය රසය නිති විඳිනා පිරිවර බෝ වේ වා!

ගරු මාලනී ජයසිංහ මැතිණිය වෙත

ප්‍රණාමය සමඟින් පිදෙන්නා වූ

ස්තූති පත්‍රයයි මේ !

වැඩිහිටියනට මිතුරියකි ඔබ ! යෞවනයට මවකි ඔබ ! ඔබගේ ආදර්ශ පාඨයයි මේ;

“අප මෙලොවට එන්නේ වරකි. ඉතින් අපි කරමු අනුනට උපකාර ! ”

“To recognize people when they are alive is a most thoughtful move because they are able to carry with them such memories as long as they live……..”

පින්සල ෂ්‍යාමෙන් ජයසිංහ මහත්තයාගෙ ඊ-මේල් එකේ අන්තිම කොටස මහ හයියෙන් කියෙව්වා. හැමෝටම සුභ අළුත් අවුරුද්දක් !

සිසිර දිසානායක

ඇඩ්වටයිස් in Sannasa
the best way to talk to the Sri Lankan Community
Call Asoka - 0425 720 932